# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 54 දරන සෙරෙන්ඩිබ් අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 28 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 02 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 54 දරන සෙරෙන්ඩිබ් අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 සැප්තැම්බර් මස 28 වන දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී) 25/2005.

### සෙරෙන්ඩිබ් අධ්‍යාපනික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"සෙරෙන්ඩිබ් අධ්‍යාපනික පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද; එකී පදනම සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 54 දරන සෙරෙන්ඩිබ් අධ්‍යාපනික පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන් පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) සෙරෙන්ඩිබ් අධ්‍යාපනික පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සෙරෙන්ඩිබ් අධ්‍යාපනික පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමට හා පාවිච්චි කිරීමට ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද, සංස්ථාවට පූර්ණ බලය සහ අධිකාරය ඇත්තේ ය. සෙරෙන්ඩිබ් අධ්‍යාපනික පදනම සංස්ථාගත කිරීම.

2—PL 003910 -2,690 (2009/05)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනික, කාර්මික සහ වෘත්තීය නිපුණතාවන් ද, ආර්ථික තත්ත්වයන් ද නංවාලීම පිණිස ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සහ වෘත්තීය මාර්ගෝපදේශකත්වය ලබා දීම සඳහා සංස්ථාවේ අරමුදල් යෙදවීම;

(ආ) කාර්මික අධ්‍යාපනය ද ඇතුළුව අධ්‍යාපනික සංවර්ධනය සඳහා සහයෝගය දැක්වීම සහ මග පෙන්වීම; සහ

(ඇ) ශ්‍රී ලාංකික මුස්ලිම් ජනතාවගේ සමාජ සහ සංස්කෘතික සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා සහයෝගය දැක්වීම.

සංස්ථාව සතු සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට පහත දැක්වෙන බලතල ඇත්තේය:—

(අ) මුදලින් හෝ ද්‍රව්‍ය මගින් ප්‍රදාන, ත්‍යාග, පරිත්‍යාග සහ දායක මුදල් ලබාගැනීම;

(ආ) බැංකු ගිණුම් ආරම්භ කර පවත්වා ගෙන යාම සහ වසා දැමීම;

(ඇ) ඇපයක් ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ රැස් කිරීම ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල සේවයෙහි යොදවා ගැනීම, නියුක්ත කර ගැනීම සහ සේවයෙන් පහ කිරීම; සහ

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමට හා මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය වන ආකාරයෙන් සෙසු සියලු කටයුතු ඉටු කිරීම සහ ක්‍රියාවට නැංවීම.

5. (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ විධිවිධානවලට හා 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් මගින් සිදු කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මණ්ඩලය, සභාපතිවරයකුගෙන් ද, උප සභාපතිවරුන් දෙදෙනකුගෙන් ද, භාණ්ඩාගාරික, සහකාර භාණ්ඩාගාරික, ලේකම්, සහකාර ලේකම්ගෙන් ද, සාමාජිකයන් විසින් වාර්ෂිකව සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන තවත් සාමාජිකයන් පස් දෙනකුගෙන් ද, සමන්විත විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ ධුර දැරූ තැනැත්තන්ගෙන් සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය සමන්විත විය යුතු ය.

6. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) මණ්ඩලයේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වල ගණපූරණය;

(ආ) මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම, පත් කිරීම හෝ ඉවත් කිරීම;

(ඇ) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ඈ) මණ්ඩලයේ කාර්යය සහ සංස්ථාවේ විවිධ නිලධරයන් හා සේවකයන්ගේ කාර්යය; සහ

(ඉ) සංස්ථාවේ අරමුදල් පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදන ලද රීති, එම උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම එවැනි ම රැස්වීමක දී, කලින් කල වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට-

(අ) මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ බැරට පැවති සියලු මුදල්වලින් ; සහ

(ආ) ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල් සහ ප්‍රදාන ලෙස සංස්ථාව වෙත ලැබුණු සියලු මුදල්වලින්,

සමන්විත අරමුදලක් තිබිය යුතු ය.

(2) අරමුදලේ බැරට ඇති සියලු මුදල් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීමේ දී සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ දී දරන ලද වියදම් පියවීම සඳහා යොදවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු හෝ සංස්ථාවට අයවිය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පැවති සියලු ණය හා බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, පරිත්‍යාග සහ දායක මුදල් ඇතුළුව එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ දායක මුදල්, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට, සංස්ථාවට නීතියෙන් බලය සහ ශක්‍යතාව ඇති අතර, ඒ සියලු දේපළ මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. සංස්ථාවේ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට හැකි මුළු බලය සංස්ථාවට ඇත්තේ ය.

10. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. විගණනය සහ ගිණුම්.

(2) සංස්ථාව විසින් සංස්ථාවේ ආදායම් හා වියදම්, වත්කම්, බැරකම් සහ එහි වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් මණ්ඩලය විසින් එම කාර්යය සඳහා ම පත් කරන ලද සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සෑම වර්ෂයකට ම එක් වරක් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයකු" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

11. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැරකම් බේරුම් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආදායමක් හෝ දේපළක් තම සාමාජිකයන් අතර බෙදා දීම එම ආයතනයේ හෝ ආයතනවල රීති මගින් තහනම් කරනු ලැබ අත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම, සංස්ථාවේ සාමාජිකයන් විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

සංස්ථාවේ මුද්‍රාව.

**12.** මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කවර වූ සාධන පත්‍රයකට වුව ද සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. තව ද, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාමාජිකයන් විසින් එම සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13 ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.